අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක :- 462

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිලධාරීන් උපරිම වැටුප් තලයට පැමිණීමෙන් පසුව උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධව</u>**

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 හි 3.8 ඡේදය පරිදි 2016.01.01 දිනෙන් පසුව උපරිම වැටුප් තලයට පැමිණෙන උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිලධාරීන්ට උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් වර්ධක ගෙවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වන අතර ඒ අනුව ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සළකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස දැන්වීමට තීරණය කර ඇත.

02. අංක 2088/26 හා 2018.09.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය නිකුත් කිරීමට පෙර උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ඇතැම් සේවා ශ්‍රේණිවලට බඳවා ගන්නා ලද නිලධාරීන් අදාල වැටුප් පරිමාණවල මුල් වැටුප් පියවර නොවන වැටුප් පරිමාණයේ අතරමැදි වැටුප් පියවරක, ආරම්භක වැටුප පිහිටුවමින් බඳවා ගන්නා ලද අවස්ථා සහිත බැවින් එම නිලධාරීන් විශ්‍රාම යාමට ප්‍රථම වැටුප් පරිමාණයේ උපරිම වැටුප් තලයට එළඹෙන බව නිරීක්ෂණය කර ඇත.

03. ඒ පිළිබඳ සලකා බලන ලදුව, 2088/26 හා 2018.09.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන 2018.08.01 දිනට පෙර සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් විශ්‍රාම යාමට පෙර උපරිම වැටුප් තලයට පැමිණ ඇත්නම් උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් වර්ධක ගෙවීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට තහවුරු කරගැනීමට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමැතිය ලබා දීමට කටයුතු කළ යුතු බවට තීරණය කර ඇත.

i. නිලධාරිනියට එරෙහිව විනය කටයුත්තක් නොමැති බව.
ii. වැටුප් වර්ධක කාලයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.
iii. ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව වැටුප් වර්ධක උපයාගෙන ඇති බව.

04. උපරිම වැටුප් තලයෙන් පසුව වැටුප් වර්ධක ගෙවීම සඳහා වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප් තල දෙක අතර වෙනස වැටුප් වර්ධකය ලෙස සලකා වැටුප් පියවර ගණනය කළ යුතුය.

05. මෙම චක්‍රලේඛය 2023.09.01 දින සිට ක්‍රියාත්මක වේ.

06. ඒ අනුව 2023.09.01 දිනෙන් පසුව උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් වර්ධක ගෙවීම් සම්බන්ධයෙන් වූ නිලධාරීන්ගේ ඉල්ලීම් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත එවීමට අවශ්‍ය නොවන බවත් අදාල ඉල්ලීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස ඔබට කටයුතු කළ හැකි බවත් මෙයින් දන්වමි.

07. 2016.06.24 දින දරණ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 386 හි 3.8 ඡේදය 2023.09.01 දින සිට ඉවත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 සැප්තැම්බර් මස 01 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්.
අධිකරණ සේවා කොමිෂන් සභාව,
කොළඹ 12